**හම්බන්තොට මහා නගර සභාව - 2023**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හම්බන්තොට මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන්, අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල  උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ  මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මෙම වාර්තාවේ 1.6.1 (ඉ) නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයන්ට හා සමාලෝචිත වර්ෂයේදී බදු දුන් පිළිවෙළින් කඩ කාමර 15 කින් අය කළ එකතුව රු.4,640,100 ක් හා කඩ කාමර 04 කින් ලැබිය යුතු එක්වන් මුදල් රු.682,000 ක් සමුච්චිත අරමුදලට සහ ආදායම් ගිණුමට බැර කර නොතිබූ අතර තැන්පතුවක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | වසර 05 ක් ඉක්ම වූ එක්වන් මුදල් නොමැති බැවින් ආදායමට ගැනීමට කටයුතු නොකළ බව. | එක්වන් මුදල් ආදායමක් ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2016 වර්ෂයේදී මිලදීගෙන තිබූ රු.663,000 ක් වූ තොරතුරු හා කළමනාකරණ පද්ධතිය සඳහා වූ වාර්ෂික ගිවිසුම යාවත්කාලීන නොකිරීම මත මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට ගිණුම්ගත කළ යුතු අස්පෘශ්‍ය වත්කම්වල වටිනාකම අඩුවෙන් දැක්වුණි. | මුදල් කාරක සභාවේ නිර්දේශය අනුව අස්පෘශ්‍ය වත්කම් වටිනාකම ගිණුම්වලින් ඉවත් කළ බව. | වත්කම් ඉවත් කිරීම් නිවැරදිව සිදුකළ යුතුය. |
| (ඇ) | එකතු වටිනාකම රු.648,344 ක් වූ තොග අයිතම 11 ක් යන්ත්‍ර හා උපකරණ සහ ලී බඩු හා සවිකිරීම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | රු.82,400 ක් වටිනා අයිතමයන් නිවැරදි කිරීමට කටයුතු කළ බවත්, අනෙකුත් අයිතම වර්ෂයකට වඩා වැඩි කාලයක් භාවිතයට ගත හැකි බැවින් හා වැඩි වටිනාකමකින් යුක්ත වන බැවින් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කල බව | තොග අයිතම ස්ථාවර වත්කම ලෙස ගිණුම්ගත නොකළ යුතුය. |
| (ඈ) | කර්මාන්ත ණයගැති වටිනාකම රු.555,948 ක් වැඩියෙන් ද ගෙවිය යුතු කර්මාන්ත ණයහිමි හා පරිපාලන වියදම් රු.231,235 ක් අඩුවෙන් ද ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී ජර්නල් සටහන් මඟින් නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව | ණයගැතියන් හා ණයහිමියන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ඉකුත් වර්ෂයේදී හම්බන්තොට මහජන පුස්තකාලයට පරිත්‍යාගයක් ලෙස ලැබී තිබූ පරිගණක උපාංග සහ අන්තර්ජාල උපකරණවල වටිනාකම වූ රු.280,674 ක් ඉකුත් වර්ෂයේදී ගිණුම්ගත කර නොතිබීම සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | පරිත්‍යාග උපාංග වල නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සීනුක්කුගල නෙළුම් මාවත වටරවුම් මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා ගෙවිය යුතු රු.146,254 ක් වූ 10% රඳවුම් මුදල් ආපසු ගෙවිය යුතු තැන්පතුවක් ලෙස සමාලෝචිත වර්ෂයේ අවසානයට ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව. | ආපසු ගෙවිය යුතු තැන්පතු නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | ඉදිරි වර්ෂය වෙනුවෙන් ගෙවීම් කර තිබූ රු.95,638 ක වියදම් පෙර ගෙවුම් ලෙස ගිණුම්ගත නොකර සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | පෙර ගෙවුම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) | ප්‍රාග්ධන ලැබීම්වල වටිනාකම රු.374,426 ක් හා ප්‍රාග්ධන වැඩසටහනක වියදම රු.272,305 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ප්‍රාග්ධන ලැබීම් හා වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (එ) | බෝක්කුව ඉදිකිරීමට හා නෙළුම් මාවත සංවර්ධනය කිරීමට අදාළ රු.5,898,978 ක ප්‍රාග්ධන ආදායම භෞතික සැලසුම්, මංමාවත් සහ ඉඩම් ගොඩනැගිලි වැඩසටහන යටතේ ගිණුම්ගත කළ යුතු වුවත්, සුභසාධන සේවා වැඩසටහන යටතේ ගිණුම්ගත කර තිබුණි. | මෙවැනි අඩුපාඩු සිදු නොවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව. | ආදායම් වලට අදාළ වැඩසටහන නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 6.1 වගන්තිය | දින දෙකකට වඩා අසනීප නිවාඩු ලබා ගන්නා සේවකයන් වෛද්‍ය සහතිකයක් ලබාගෙන ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කර නිවාඩු අනුමත කර ගැනීමට කටයුතු කළ යුතු වුවත්, එපරිදි වෛද්‍ය සහතික ඉදිරිපත් නොකර 2022 හා 2023 වර්ෂයන්හී දී සෞඛ්‍ය කම්කරුවන් 15 දෙනෙකු විසින් දින 942.5 ක් නිවාඩු ලබාගෙන තිබුණි. | එක් සෞඛ්‍ය කම්කරුවෙකු මිය ගොස් ඇති බවත්, අනෙකුත් සෞඛ්‍ය කම්කරුවන් වෙත වෛද්‍ය වාර්තා කඩිනමින් ලබා දෙන ලෙස ලිපි යොමු කළ බවත්, මාර්ග කම්කරුවන් හතරදෙනා වෛද්‍ය සහතික ලබා දී ඇති බව | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | ඉකුත් වර්ෂයන්ට අදාළ වසර 02 ඉක්ම වූ රු.569,337 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පත් ශේෂ 107 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.25,007,545 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු15,404,146 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 13,937,000 | 13,939,528 | 14,205,275 | 6,415,325 | 12,736,600 | 13,408,278 | 12,395,219 | 6,681,072 |
| කුලී | 41,795,000 | 45,058,599 | 40,905,201 | 7,043,538 | 35,723,700 | 36,718,866 | 37,387,859 | 2,890,140 |
| බලපත්‍ර ගාස්තු | 4,027,000 | 5,558,941 | 4,974,331 | 3,340,633 | 3,470,000 | 4,999,700 | 3,682,523 | 2,756,023 |
| වෙනත් ආදායම් | 7,331,000 | 11,279,314 | 11,060,858 | 2,507,983 | 6,132,400 | 7,846,829 | 6,919,199 | 2,289,527 |
| **එකතුව** | **67,090,000** | **75,836,382** | **71,145,665** | **19,307,479** | **58,062,700** | **62,973,673** | **60,384,800** | **14,616,762** |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් ඒකක 6516 කින් ලැබිය යුතු වරිපනම් බදු රු.5,558,137 ක් හා කඩකාමර හා ගොඩනැගිලි බදුදීම වෙනුවෙන් ඒකක 83 කින් ලැබිය යුතු කුලී රු.6,548,904 ක් අයකර ගැනීමට මහා නගර සහා අඥා පනතේ පිළිවෙළින් 252 (1) හා 253(1) වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු වරිපනම් බදු හා කුලී ලෙස පිළිවෙළින් රු.717,565 හා රු.3,546,467 ක් අයකර ගෙන ඉතිරි හිඟ කුලී මුදල සඳහා නඩු පවරා ඇති බව | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආයතන 28 කින් ලැබිය යුතු කසළ බදු රු.439,988 ක් හා ලැබිය යුතු වාහන කුලී රු.494,635 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කසළ බදු රු.315,818 ක් හා වාහන කුලි රු.484,900 ක් අයකරගෙන ඇති බවත්, ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරන බව | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඇ) | ව්‍යාපාර හා කර්මාන්ත ඒකක 201 කින් ලැබිය යුතු රු.417,200 ක බදු හා ව්‍යාපාර ඒකක 152 කින් ලැබිය යුතු රු.380,000 ක වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට මහා නගර සභා ආඥා පනතේ 247 (ආ) 4 වගන්තිය පරිදි කටයුතු කර නොතිබුණි. වෙළඳ බලපත්‍ර ගාස්තු හිඟ ශේෂය තුල වර්ෂයකට වැඩි හිඟය රු.284,500 ක් වූ අතර ඉන් රු.279,500 ක් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගතයුතු කාලයද ඉක්මවා ගොස් තිබුණි. | ව්‍යාපාර හා කර්මාන්ත බදු රු.9,000 ක් අය කරගෙන රු.123,000 ක් සඳහා නඩු පවරා ඇති බව හා වෙළඳ බලපත්‍ර ගාස්තු රු.12,500 ක් අයකර ගෙන ඇති බව මෙන්ම ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරන බව | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඈ) | රුහුණු ප්ලාසා ගොඩනැගිල්ලෙහි පළමු මහල හා දෙවන මහල බදුගත් බදුකරු විසින් සභාව සමඟ ගිවිසගත් බදු ගිවිසුමේ කොන්දේසි අංක 2.08 අනුව මාසික කඩ කුලිය අදාළ මාසයේ 10 දින හෝ ඊට පෙර ගෙවීම් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානයට බදුකුලී ගෙවීම අඛණ්ඩව මාස 06 ක් පැහැර හැර තිබීම නිසා ගිවිසුම අවලංගු වන බව හා බදු ගැණුම්කරු ගොඩනැගිල්ලෙන් නෙරපා දැමීමට සභාවට බලය ඇති බවට සඳහන්ව තිබුණද එම කොන්දේසි කෙරෙහි සභා කළමනාකාරිත්වයේ අවධානය යොමු වී නොතිබුණු අතර ලැබිය යුතු රු.1,116,000 ක කඩකුලී ශේෂය තුළ මාස 06 ඉක්ම වූ ශේෂය රු.855,000 ක් විය. | රු.255,000 ක් අයකරගත් බවත්, මාස 06 ඉක්ම වූ හිඟ මුදල් අයකර ගැනීම සඳහා මාස 06 ක සහන කාලයක් පලාත් පාලන කොමසාරිස් විසින් ලබාදුන් බව | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඉ) | ලැබිය යුතු දැන්වීම් පුවරු ගාස්තු රු.2,910,983 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඉන් ඉකුත් වර්ෂයන්ට අදාළව ලැබිය යුතු ශේෂය රු.1,570,783 ක් විය. | රු.46,800 ක් අයකර ගෙන ඇති අතර, රු.2,864,183 ක් අයකර ගැනීමට නඩු පවරා ඇති බව | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඊ) | කර්මාන්ත 17 ක් වෙනුවෙන් රු.84,150 ක පරිසර බලපත්‍ර ගාස්තු ආදායම් හා ලැබිය යුතු වරෙන්තු ගාස්තු, දඩපොලී හා සේවා සඳහා ගාස්තු රු.2,104,539 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පරිසර බලපත්‍ර ගැනීමට ලිඛිතව දැනුවත් කළ බව හා වරෙන්තු ගාස්තු රු.114,936 ක්, සේවා ගාස්තු රු.158,880 ක් හා දඩපොලී රු.325,287 ක් අයකර ගත් බවත් ඉතිරි හිඟ සඳහා නඩු පැවරූ බව. | පරිසර බලපත්‍ර ලබා ගැනීමට උනන්දු කළ යුතු අතර හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| (උ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.801,166 ක් හා රු.6,980,064 ක් විය. | හිඟ උසාවි දඩ රු.544,675 ක් හා හිඟ මුද්දර ගාස්තු රු.2,461,325 ක් අයකර ගෙන ඇති බව. | හිඟ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.938,500 ක වියදමක් දරා සභාව විසින් 2016 වර්ෂයේදී මිලදීගෙන තිබූ තොරතුරු හා කළමනාකරණ පද්ධතිය අපේක්ෂිත ආකාරයෙන් ක්‍රියාත්මක නොවීම සහ ප්‍රතිඵල නොලැබීම නිසා සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් මාසයේදී පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ තීරණයක් අනුව බැහැර කිරීමට තීරණය කිරීම නිසා පද්ධතිය මිලදී ගැනීමට දැරූ වියදම සහ නඩත්තුව වෙනුවෙන් දරන ලද වියදම් වල එකතු වටිනාකම වූ රු.1,942,870 කින් සභා අරමුදලට පාඩුවක් සිදුව තිබුණි. | මෙමඟින් සිදුවිය යුතු කාර්යයන් කිසිවක් සිදු වී නොමැති වීමත් ඒ හරහා නිවැරදිව දත්ත හා වාර්තා ලබා ගැනීමට නොහැකි වීමත් නිසා වාර්ෂිකව නඩත්තු වියදම් ගෙවීම් කිරීමෙන් සභා අරමුදලට සිදුවන මූල්‍ය පාඩුව වළක්වා ගැනීමට මෙම තීරණය ගත් බව | වත්කම් ඵලදායිව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 හා 2023 වර්ෂයන්හිදී සභාවේ සේවයේ නියුතු ආදේශක/ කොන්ත්‍රාත් සේවකයින් සඳහා මාසික වැටුපෙන් රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු දායක මුදල් ගෙවීමේදී ඊට අදාළ විස්තරවල සඳහන් කළයුතු දායකයින්ගේ ජාතික හැඳුනුම්පත් අංක හා සාමාජික අංක නොතිබීම නිසා 2022 වර්ෂයේ දෙසැම්බර් මස සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා වූ එකතුව රු.842,732 ක රාජ්‍ය සේවක අර්ථසාධක දායක මුදල් සභාවේ තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | දායක මුදල් වලට අදාළ සේවකයින්ගේ ජාතික හැඳුනුම්පත් අංක හා සාමාජික අංක සම්පූර්ණ වනතුරු දායක මුදල් සභාවේ තැන්පත් කර ඇති බව. | දායක මුදල් සේවක අර්ථසාධක අරමුදලට ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ඉදිකිරීම් කටයුතු සඳහා සභාව වෙත ඉදිරිපත් කර අනුමත කර ගෙන තිබූ ගොඩනැගිලි සැලසුම් 02 කට අදාළව අනුමත ප්‍රමාණය ඉක්මවා සිදුකර ඇති ඉදිකිරීම් වෙනුවෙන් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතට 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් කරනු ලැබූ සංශෝධන අනුව අයකළ යුතු රු.327,720 ක ආවරණ අනුමැතිය ලබාදීමේ ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී කඩිනමින් අදාළ ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව. | පනතේ හා සංශෝධිත ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනතේ 45 වන වගන්තිය ප්‍රකාරව සභාව භුක්ති විඳින ඉඩම් 80 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගැනීමට සභා කළමනාකාරිත්වය කටයුතු කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය පවරා ගැනීම සඳහා අදාළ ආයතන වෙත ලිපි මඟින් දැනුවත් කර ඇති බව | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගත යුතුය. |
| (ආ) | 2020 වර්ෂයේදී ධාවනයෙන් ඉවත් කළ වාහන 02 ක් අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට සහ වාහන 03 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | එක් රථයක් අලුත්වැඩියා කිරීමට සහ ඉතිරි රථය සඳහා ලියාපදිංචි ආයතනයෙන් එකඟතාවය ලද පසු අපහරණය කරන බවත්, වාහන 03 සභාව වෙත පවරා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇති බව. | වත්කම් අලුත්වැඩියාකර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතු අතර වත්කම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගත යුතුය. |

**3.4 ව්‍යාපෘති, කතර්ව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට වාර්ෂික අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන වෙන් කර තිබූ එකතු වටිනාකම රු.15,000,000 ක් වූ සංවර්ධන යෝජනා 06 ක් අරමුදල් නොමැති වීම හා ප්‍රතිපාදන නොලැබීම මත සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි. | සභා ආදායම් පහළ මට්ටමක පැවති බැවින් සංවර්ධන යෝජනා සිදු කිරීමට නොහැකි වූ බව | අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් කර ඇති සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කළ යුතුය. |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හම්බන්තොට මයුරපුර රොටරි නිවාස සංකීර්ණයේ සුභද්‍රා නිවස අසළ රුවන්පුර කාපට් මාර්ගය දක්වා මාර්ගයෙහි බෝක්කුව හියුම් පයිප්ප යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.930,374 ක වියදමක් දරා තිබුණ ද බෝක්කුව දෙපස පස් පුරවා මාර්ග සකස් කර නොතිබීම නිසා ඉදිකරන ලද බෝක්කුව ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි.. | පස් ප්‍රවාහනය සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අනුමැතිය ලැබී නොමැති නිසා අනුමැතිය ලැබීමෙන් පසුව පස් පුරවා මාර්ගය සකස් කරන බව | වැය කළ මුදලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිවෙලින් 169 ක් හා 189 ක් වූයෙන් තනතුරු 05 කට අදාළ අතිරික්තතා 38 ක් විධිමත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අතිරික්තය අනුමත කර ගැනීමට ඉල්ලීම් කළ බව | අතිරික්තතා විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සේවය හැරගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් ලැබිය යුතු එකතුව රු.35,495 ක උත්සව හා විශේෂ අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |